## කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

2013 පෙබරවාරි 28 දින ඉවත්කර ගන්නා ලද 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කිරීමේදී පැවති ප්‍රමාණාත්මක දෝෂ හේතුවෙන් ආයතනය විසින් ඒවා 2013 ජුනි 01 දින ඉවත් කරගෙන සංශෝධනය කර 2013 ජුනි 19 දින නැවත ඉදිරිපත් කර තිබුණි.

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

ආයතනයේ වාර්ෂික ආදායම් හා වියදම් ප්‍රකාශනවල දිගින් දිගටම ඌනතාවයන් ඇති වීම හේතුවෙන් 2008 දෙසැම්බර් 31 දිනට රු. 8,682,094 ක් වූ ශුද්ධ වත්කම් 2012 දෙසැම්බර් 31 දිනට (වර්ෂ 05 තුළ) රු.4,288,464 ක් දක්වා රු.4,393,630 කින් හෙවත් සියයට 50 කින් බාදනය වී තිබූ නමුත් ඒ කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

#### 1.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හා 3 අනුව වත්කම්, වගකීම්, ශුද්ධ වත්කම්, ආදායම් හා වියදම් උපචිත පදනමට අනුගත වෙමින් ගිණුම් තැබිය යුතු වුවත් ආයතනයේ පාඨමාලා වියදම් "මුදල් පදනම" මත ගිණුම්ගත කිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වී තිබුණි.

#### 1.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

1995 ඔක්තෝබර් 05 දිනැති අංක 649 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව මිලදී ගත් දින පටන් ක්ෂය කළ යුතු ස්ථාවර වත්කම්, මිලදී ගත් වර්ෂයේ දී ක්ෂය නොකර ඉවත් කරන වර්ෂයේදී සම්පූර්ණ වර්ෂයටම ක්ෂය කිරීම ආයතනයේ ප්‍රතිපත්තිය වී තිබූ අතර එම චක්‍රලේඛ උපදෙස් අනුව සියයට 20 බැගින් ක්ෂය කළයුතු මෝටර් වාහන හා කාර්යාල උපකරණ සියයට 10 බැගින්

ක්ෂය කර තිබුණි. එම චක්‍රලේඛයේ උපදෙස් පරිදි වෙනම ගිණුම්ගත කළ යුතු කාර්යාලීය උපකරණ ලී බඩු යටතේ ගිණුම්ගත කිරීම නිසා හඳුනා ගැනීමටද නොහැකි වී තිබුණි.

### 1.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල නිවැරද පාඨමාලා ආදායම ගණනය නොකර පාඨමාලා වියදමට සමාන ප්‍රමාණයක් පාඨමාලා ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. තවද , පාඨමාලා ගාස්තු ලැබීම් නිවැරදිව ලෙජර් ගිණුම් ගත නොවීම හා පාඨමාලා ආදායම් ලේඛන විධිමත්ව පවත්වා නොගැනීම නිසා අවසන් ගිණුම්වලින් නිරූපිත රු.3,096,293 ක්වූ පාඨමාලා ආදායම සහ රු.3,232,110 ක්වූ ඉදිරියට ලැබූ පාඨමාලා ආදායමෙහි නිවැරදිතාවය තහවුරු නොවුණි.

(ආ) ශිෂ්‍ය සංඛ්‍යාව අවම වීම හේතුවෙන් නොපවත්වන ලද පාඨමාලා තුනක් සඳහා ශිෂ්‍යයන්ට ගෙවිය යුතු මුදල රු. 33,500 ක් වුව ද එය රු. 61,000 ක් ලෙස ගිණුම්ගත කර පාඨමාලා ආදායම ලෙස රු. 35,300 ක් ආදායම් හා වියදම් ගිණුමට බැර කර තිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් ගිණුම් විෂයයන් වලට අදාල සාක්ෂි ඉදිරිපත් නොවීය.

| | විෂය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| (අ) | ගෙවිය යුතු පුස්තකාල තැන්පතු | 310,000 | විස්තරාත්මක උපලේඛනය |
| (ආ) | පාඨමාලා ආදායම් (සහතිකපත් පාඨමාලා) | 974,270 | එම |
| (ඇ) | පාඨමාලා ආදායම් ( පශ්චාත් උපාධි) | 2,122,023 | එම |
| (ඈ) | වැඩමුළු හා සම්මන්ත්‍රණ ආදායම් | 1,755,341 | එම |

### 1.2.6 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියමාවලිය | |
| (i) 10(9) ඡේදය | වර්ෂයකට අවස්ථා 08 කට නොඅඩු වාර ගණනක් කළමනාකරණ මණ්ඩලය රැසවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 05 කදී පමණක් රැස්වී තිබුණි. |
| (ii) 12(6) ඡේදය | වර්ෂයකට අවස්ථා 10 කට නොඅඩු ශාස්ත්‍රීය කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදි රැස්වීම් 05 ක් පමණක් පවත්වා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ.371 (2)(ආ) | අත්තිකාරම් ලබාදිය යුතු කාර්යයන්, නිලධාරීන් සහ සීමා නිර්ණය කිරීමකින් තොරව අවස්ථා 07 ක දී රු. 20,500 සිට 312,500 ත් අතර, මුළු වටිනාකම රු. 802,000 ක් වූ අත්තිකාරම් ලබා දී තිබූ අතර විධිමත් ඇස්තමේන්තු වලින් තොරව අවස්ථා 07 කදී ලබාදුන් රු. 543,000 ක අත්තිකාරම් මුදලෙන් රු. 269,416 ක් හෙවත් සියයට 50 ක් ඉතිරි වී තිබුණි. |
| (ii) මු.රෙ. 570 හා 571 | 2004-2009 අතර කාලය තුළ පාඨමාලා හදාරා අවසන් කර තිබූ ශිෂ්‍යයින් 56 දෙනෙකු ගෙන් පුස්තකාල තැන්පතු ලෙස ලබා ගන්නා ලද රු. 150,000 ක් ආදායමට බැර කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.2. ඡේදය | ගිණුම් පිළිබඳ විගණකාධිපති වාර්තාව දින 30 ක් ඇතුළත කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර එහි ඇතුළත් කරුණු පිළිබඳව ගන්නා ලද ක්‍රියාමාර්ග විගණකාධිපති වෙත වාර්තා කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ලේඛනය අසම්පූර්ණ තත්ත්වයේ පැවතුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එම වත්කම් පිරිවැය රු. 6,994,523 ක් වී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.11,244,162 ක ඌනතාවයක් වු අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,086,796 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුණු රු.9,463,000 ක් වු රජයේ ප්‍රදානය හේතුකර ගෙන එම ඌනතාවය රු.1,781,162 ක් දක්වා අඩු වී තිබු අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම් සඳහා ලැබී තිබුණු රු.7,755,073 ක් වු රජයේ ප්‍රදානය හේතුකර ගෙන එම ඌනතාවය රු.1,331,723 ක් දක්වා අඩුවී තිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී රජයේ ප්‍රදානය ඇතුළු ආයතනයේ මුළු ආදායම රු.3,613,519 කින් වැඩි වී තිබුණද මුළු වියදම ඉකුත් වර්ෂයට වඩා රු.4,062,958 කින් හෙවත් සියයට 32 කින් ඉහලයාම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලය රු.449,439 කින් පිරිහිමට හේතුවී තිබුණි.

### 2.2 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම

ආදායම් හා වියදම් ගිණුමේ ඇතුළත් පාර්තෝෂික හා ක්ෂය වෙන්කිරීම් හැර ඉතිරි වැය ශීර්ෂ 06 න් 05 ක 2011 දෙසැම්බර් 31 දිනට රු.11,127,268 ක් වු මුළු වියදම 2012 දෙසැම්බර් 31 දිනට රු.14,789,606 ක් දක්වා රු.3,662,338 කින් ඉහල ගොස් තිබුණි.

### 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ශේෂපත්‍රයේ රු.5,952,221 ක්වූ ජංගම වත්කම් හා රු.4,376,961 ක්වූ ජංගම බැරකම් අතර අනුපාතය 1.36:1 ක් වු අතර ඉදිරියට ලැබූ පාඨමාලා ගාස්තු රු. 3,232,110 ක් හා ගෙවිය යුතු පුස්තකාල තැන්පතුව රු. 310,000 ක් ලෙස රු. 3,542,110 ක් වූ ගෙවිය යුතු වටිනාකම් නියෝජනය වන මුදල් පොතේ ශේෂය රු. 503,506 ක් පමණක් වී තිබුණි. ඒ අනුව ආයතනයේ ද්‍රවශීලතා අර්බුදයක් ඇතිවිය හැකි බවට විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ලෝක බැංකුවේ දෙවන සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘති ආධාර යටතේ ස්ථාපිත කර ඇති ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ මූලික අරමුණු වාර්ෂිකව සිසුන් 300- 400 ත් අතර ප්‍රමාණයක් පුහුණු කිරීම වු අතර පුස්තකාල හා විඥාපන විද්‍යා සම්බන්ධයෙන් පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රිය විශිෂ්ඨතා ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය බලතල 1999 අංක 1 දරන පුස්තකාල හා විඥාපන විද්‍යා අයතන නියමාවලිය මඟින් ලබා දී තිබුණි. එසේ වුවද, පාඨමාලා ආරම්භ කරන ලද 2003 වර්ෂයේ සිට 2012 දක්වා වර්ෂ 10 ක් තුළ පාඨමාලා 73 ක් යටතේ ලියාපදිංචි වු ශිෂ්‍ය සංඛ්‍යාව 1614 ක් ව අතර එයින මෙතෙක් අවසන් කර නැති පාඨමාලා 16 ක හැර ඉතිරි පාඨමාලාවන්හ සසන් 642 දෙනෙකු පාඨමාලා සාර්ථකව අවසන් කර නොතිබුණි. එම සංඛ්‍යාව ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 47 ක් වී තිබුණි.

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**(අ) පාඨමාලා පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පාඨමාලා අයවැය ලේඛන ප්‍රමාද කර සකස් කිරීම සාමාන්‍ය ක්‍රමවේදයවීමත් අයවැයගත හා සත්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලතා පැවතීමත් හේතුවෙන් පාඨමාලා අයවැය ලේඛන පාලන උපකරණයක් ලෙස භාවිතා කර නොතිබුණි.

(ii) පාඨමාලා 03 ක අයවැයගත ආදායම රු.361,325 කින් ඉක්මවා වියදම් කර තිබුණත් එම වියදම පියවා ගන්නා ආකාරය හඳුනාගෙන නොතිබුණි.

(iii) ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 05 ක් පමණක් වීම හේතුවෙන් පැවැත්වීමට නොහැකි වූ පාඨමාලා 04 ක් සඳහා දරන ලද රු. 23,281 ක් වූ වියදම නිෂ්කාර්ය එකක් වී තිබුණි.

(iv) සිසුන් 07 දෙනෙකුගේ ලියාපදිංචිය සහිතව වසර 02 ක කාලයක් සඳහා 2007 අගෝස්තු මස ආරම්භ කරන ලද පශ්චාත් උපාධි පාඨමාලාව වසර 05 මාස 07 ක් ඉක්මවා ගොස් අවසන් කිරීමට නොහැකි වී තිබූ අතර සිසුන් 03 දෙනෙකුගේ ශිෂ්‍යභාවය අහෝසි කර තිබුණි. පාඨමාලා අයවැය සංශෝධනය කිරීමකින් තොරවම අනුමත ප්‍රතිපාදනය 130,000 ක් ඉක්මවා පාඨමාලා සම්බන්ධීකරණ ගාස්තු ගෙවා තිබුණි.

(v) පාඨමාලාවන්ට ගැලපෙන ආකාරයට දේශන ශාලා සංවිධානය වී නොතිබූ අතර, බොහෝ පාඨමාලා සති අන්තයේ පැවැත්වන බැවින් සතියේ දිනවල ඒවා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) **පර්යේෂණ සමුළුව**

2012 නොවැම්බර් 22 සිට 23 දක්වා කාලය තුළ පැවති පර්යේෂණ සමුළුව සඳහා අයවැය ලේඛනයක් සකස් කර නොතිබූ අතර එහි රු.850,740 ක් වූ ආදායමෙන් රු. 92,686 ක් ඉක්මවා රු. 943,426 ක් වැය කර තිබුණි.

### 3.3 වාහනය උපයෝජනය

වසර 09 කට පෙර අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ලබාදෙන ලද පිරිවැය රු. 3,603,493 ක් වූ වාහනය ආයතනය නමින් ලියාපදිංචි කර නොතිබූ අතර එම වාහනයේ ලොග් පොත් ද අසම්පූර්ණව පැවතුණි.

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

2012-2016 වර්ෂයන්ට අදාලව පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්මෙහි 1999 අංක 01 දරන ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතන නියාමාවලියෙහි ඇතුළත් පර්යේෂණ පැවැත්වීම, සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම, ශිෂ්‍යත්ව ප්‍රදානයන් යන අරමුණු සැලකිල්ලට ගෙන නොතිබූ අතර ඉලක්කගත කාර්යයන් ලෙස ඇතුළත් කර තිබූ පාඨමාලාවන්හි ඉලක්කගත දින වකවානු, ශිෂ්‍ය සංඛ්‍යාවන් සහ ඇස්තමේන්තු ගත ආදායම් හා වියදම් විස්තර ඇතුළත් කර නොතිබුණි.

### 4.2 ක්‍රියාකාර සැලැස්ම

ක්‍රියාකාර සැලැස්මෙහි ඇතුළත් කාර්යයන්හි කාල පරාසයන්, කාර්ය ප්‍රමාණයන් සහ එම කාර්යයන් සඳහා ඇස්තමේන්තු ගත ආදායම් හා වියදම් ප්‍රමාණයන් දක්වා නොතිබූ අතර,

එහි ඇතුළත් කාර්යයන් 09 ක් ඉටුකර ගැනීමට නොහැකවී තිබුණි. ක්‍රියාකාර සැලැස්මෙහි ඇතුළත් කාර්යයන්හි ප්‍රගතිය මැනිය හැකි ආකාරයට කාර්යසාධන වාර්තාද සකස් කර නොතිබුණි.

## 4.3 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස් පරිදි අයවැය ලේඛනය පිළියෙල කර නොතිබූ අතර, සංයුක්ත සැලැස්මෙහි හා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මෙහි අස්තමේන්තුගත වටිනාකම් ඇතුළත් නොවූ හෙයින්, ඒවා සමගාමී බවට තහවුරු කිරීමටද නොහැකි විය.

(ආ) පාඨමාලා ඇගයීමකින් තොරව ඇස්තමේන්තු කරන ලද රු.2,866,000 ක් වූ අයවැයගත අභ්‍යන්තර ආදායම රු.2,612,808 කින් හෙවත් සියයට 91ක් ඉක්මවා රු.5,478,808 ක ආදායම් උපයා තිබීමත්, පුනරාවර්තන වැය ශීර්ෂ 05 ක රු.12,319,000 ක් වූ අයවැයගත වියදම සියයට 20ක් හෙවත් රු.2,470,606 ක් ඉක්මවා අනුමැතියෙන් තොරව රු.14,789,606 ක් වැයකර තිබීමත් හේතුවෙන් අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 4.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2010 හා 2011 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගතකර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින්වර යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

---

(අ) මුදල් හා බැංකු

(ආ) ගිණුම්කරණය

(ඇ) සැලසුම් සකස් කිරීම

(ඈ) අයවැය පාලනය

(ඉ) පුසතකාල පරිපාලනය

(ඊ) පාඨමාලා සංවිධානය හා පැවැත්වීම

(උ) අත්තිකාරම් ලබා දීම